"අත්අඩංගුවට ගත් ලක්ෂ 75 ක් හොරාටම දුන් හිටපු CID ලොක්කකුට වැඩ වරදී" [sic] යන සිරස්තලයෙන් යුතුව මව්බිම පුවත්පතේ (පෙබරවාරි 10, 2022) පළවී තිබූ පුවතකි. එහිදී අත්අඩංගුවට ගැනී තිබුණු "විදේශිකයන් හා මුස්ලිම් ජාතිකයන් කිහිපදෙනෙකුගෙන්" ප්‍රශ්න කිරීම පිළිබඳව පුවත් අන්තර්ගතයේ සඳහන්ව තිබිණි.

මෙම පුවතම මව්බිම සහෝදර ඉංග්‍රීසි පුවත්පත වන Ceylon Today පුවත්පතේ (පෙබරවාරි 10, 2022), "Money misappropriation case, CID probes CID officers" යන සිරස්තලයෙන් යුතුව දැක්වී තිබුණු අතර, එම පුවතේ අන්තර්ගතයේ කිසිවෙකුගේ වාර්ගිකත්වයක් විශේෂ කොට දක්වා නොතිබුණි.

පුවතකට සෘජුවම අදාළ නොවන්නේ නම් පුද්ගලයින්ගේ වාර්ගිකත්වය පුවත තුළ සඳහන් නොකරන මෙන් ශ්‍රී ලංකා කර්තෘ සංසදයෙන් හඳුන්වා දුන් ආචාර ධර්ම මාලාවේ මෙන්ම ජාත්‍යන්තර මාධ්‍ය ආචාර ධර්මයන් තුළද දැක්වේ.

එසේ නම්,

1) මව්බිම පුවත තුළ පමණක් "මුස්ලිම්" ලෙසින් පුද්ගලයින් කිහිප දෙනෙකුගේ ජාතිකත්වය දැක්වී ඇත්තේ මන්ද? එය පුවතට කෙතරම් අදාළ වන්නේ ද?

2) එය පුවතට අදාළ වේ යැයි ඔබ සිතන්නේ නම්, ඔබට අනුව Ceylon Today පුවත සමගින් එම වාර්ගිකත්වයන් පළවී නොමැත්තේ මන්ද?

3) එම වාර්ගිකත්වය දැක්වීම පුවතට අදාළ නොවන්නේ නම්, එය මාධ්‍ය ආචාර ධර්ම උල්ලංඝනයක් යැයි ඔබ නොසිතන්නේ ද?